වර්ණාවලිය வானவில்

SPECTRUM





අන්තර්ගතය සහ ප්‍රේරක නිවේදනය

මෙම චිත්‍ර කතා පොතෙහි සමලිංගික පුද්ගලයින් කෙරෙහි භීතිකාව හා බැඳි සාහසික ආකල්ප, සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින් කෙරෙහි භීතිකාව හා බැඳි සාහසික ආකල්ප ඇතුලත් වන අතර, එවැනි අන්තර්ගත කරුණු ඇතැමෙකුට කියවීමට මානසිකව අපහසු වනු ඇත,

කෘතඥතාවය

අප සමග නිර්භීතව සිය කතාන්දරය පැවසූ සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික හා අන්තර් ලිංගික (LGBTI) පුද්ගලයින්ට ඇම්නෙස්ටි ජාත්‍යන්තර සංවිධානය වශයෙන් අපි බෙහෙවින් ස්තුතිවන්ත වෙමු. තවද තමන්ට හා තම හිතවතුන්ගේ ආරක්ෂාවට තර්ජන එල්ල වෙමින් තිබියදීත් සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික හා අන්තර් ලිංගික පුද්ගලයින්ගේ අයිතීන් රැකදීමට වෙහෙස මහන්සි නොතකා ක්‍රියා කරන පුද්ගලයින් ද, සංවිධාන ද අප බෙහෙවින් අගයන්නෙමු. ඇම්නෙස්ටි ජාත්‍යන්තර සංවිධානය විසින් මෙම "වර්ණාවලිය" ප්‍රකාශනය කිරීමේදී දායක වූ භූමි හරේන්ද්‍රන්, දමිත් චන්දිමාල්, ඊක්වල් ග්‍රවුන්ඩ් සංවිධානය (EQUAL GROUND), අයිප්‍රෝබොනෝ සංවිධානය (iProbono), නෙහාමා ජයවර්ධන, තිලානි සමරසිංහ හා අනෙකුත් සියළු දෙනාටම අපගේ මහත් කෘතඥතාවය හා ස්තුතිය පළ කරමු.

© Amnesty International 2019
Except where otherwise noted, content in this document is licensed under a Creative Commons (attribution, non-commercial, no derivatives, international 4.0) licence.
https://creativecommons.org/licenses/by-nc-nd/4.0/legalcode
For more information please visit the permissions page on our website: www.amnesty.org
Where material is attributed to a copyright owner other than Amnesty International this material is not subject to the Creative Commons licence.
First published in 2019
by Amnesty International Ltd
Peter Benenson House, 1 Easton Street
London WC1X 0DW, UK

Index: ASA 37/1477/2019
Original language: Sinhala

amnesty.org

Cover artwork and chapters: :
Chapter 1- Manju: Gimhani Galagedera
Chapter 2- Kiruthika: Madhri Samaranayake
Chapter 3- Thenu: Shenuka Corea
Chapter 4-Samanali: Akiel Surajdeen

ප්‍රස්තාවනාව

1883දී ශ්‍රී ලංකා ද්වීපය පාලනය කරන ලද බ්‍රිතාන්‍යයින් විසින් ශ්‍රී ලංකාවේ සිදුවන අපරාධ මෙල්ල කිරීමට දණ්ඩ නීති සංග්‍රහය හඳුන්වා දෙන ලදී. මෙම නීති සංග්‍රහය තුලින් අපරාධ ලෙස සැලකෙන ක්‍රියාවන් මොනවාද යන්න හඳුන්වා දෙන ලදී. මෙහි අංක 365 හා 365 (අ) වගන්තිවල සඳහන් සමහර වාරණ මෙම දණ්ඩ නීති සංග්‍රහය හඳුන්වා දීමට පෙර නොතිබුණු ඒවාය. මෙම වගන්ති දෙක මඟින් "සොබාදහමේ නියමයන්ට එරෙහි කායික සංසර්ගය" හා "අශික්ෂිත අසභ්‍යතාවය" යන දේ තහනම් විය. දණ්ඩ නීති සංග්‍රහය තුල මෙම වගන්ති මඟින් නියත වශයෙන්ම කියවෙන්නේ කුමක්ද යන්න පැහැදිලිව පහදා නොතිබෙන අතර, මෙම වර්ෂ 136ක් පැරණි, අති පුළුල්, නොපැහැදිලි නීති තවමත් සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික, හා අන්තර ලිංගික පුද්ගලයින්ට එරෙහිව වෙනස්කම් කිරීම සඳහා භාවිත වේ.

දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති අංක 399 තුලින් වංචා සහගත ලෙස වෙනත් පුද්ගලයන් ලෙස පෙනීසිටීම තහනම් වන අතර, එයින් අදහස් වන්නේ "තමුන් වෙනත් පුද්ගලයෙකු ලෙස මවාපෑම" හෝ "වෙනත් අයට තමුන්ගේ අනන්‍යතාව වැරදි ලෙස ඉදිරිපත් කිරීම"ය. මෙම නීතියද සමලිංගික, ද්වීලිංගික හා විශේෂයෙන්ම සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින්ට එරෙහිව වෙනස්කම් කිරීමට භාවිත වන්නේ ඔවුන් විසින් සිය ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව වැරදි ලෙස ඉදිරිපත් කරන බව සඳහන් කරමිනි.

1841දී බ්‍රිතාන්‍යයින් විසින් පනවන ලද පාදඩ ආඥාපනත තුලින් "නොහික්මුණු හැසිරීම්වලට" දඬුවම් කරන අතර මෙය හිගමන් යැදීමේ හා ගණිකා වෘත්තියේ යෙදී සිටින අය, දුරාචාරයේ හැසිරෙන අය හා අනෙක් අයට හිරිහැර වන පරිදි හැසිරෙන අය, ඇතුළු තවත් කණ්ඩායම් තහනම් කරනු ලබනවා. මෙම වසර 178ක් පැරණි නීතිය භාවිත කර අදටත් සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික, හා අන්තර ලිංගික පුද්ගලයින්ව අසාධාරණ ලෙස ඉලක්ක කරන්නේ පොලීසියට ඔවුන්ව අත් අඩංගුවට ගෙන සිරභාරයට ගැනීමේ හැකියාව ද පවරා දෙමිනි.

මෙම යටත් විජිතවාදී නීති තවමත් ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ තිබුනද, ශ්‍රී ලාංකික රජය මගින් එක්සත් ජාතීන්ගේ සංවිධානය සමග නොයෙකුත් ගිවිසුම්වලට ඇතුළු වී ඇත. මෙසේ ඔවුන් එකඟතාවන්ට පැමිණ ඇති ගිවිසුම් අතර සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR), ආර්ථික, සමාජීය හා සංස්කෘතික

අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICESCR), කාන්තාවන්ට එරෙහි සියලු ආකාර වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (CEDAW) යන ගිවිසුම් ඇතුලත් වේ. මෙම සම්මුතින් සියළු පුද්ගලයින්ට එක හා සමානව අදාල වන හෙයින් සමහර සමාජ කණ්ඩායම්වලට ඔවුන්ගේ ලිංගික දිශානතිය (ඔවුන් ආකර්ෂණය වන ලිංගිකත්වය) , ඔවුන්ගේ උපත් ලිංගභේදය කුමක් වුවද ඔවුන්ගේ අභිමත ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය (ඔවුන්ගේ පුද්ගලික අනන්‍යතාවය) හේතුවෙන් ඔවුන්ට වෙනස්කම් කිරීමට හෝ හිරිහැර කිරීමට ඉඩ නැත. මෙම සම්මුතිවලට එකඟ වීම තුළින් ශ්‍රී ලාංකික රජය සියළු පුරවැසියන්ගේ – සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික, හා අන්තර් ලිංගික පුද්ගලයිගේ අයිතීන් සුරැකීමට ප්‍රතිඥා දෙයි.

1978දී ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසු ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට අනුව සියළුදෙනාගේම මූලික අයිතිවාසිකම් සුරැකෙන බව සනාථ කෙරේ. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව රටෙහි උසස්ම නීතිය වන අතර සියළු දෙනාම එයට අවනත විය යුතුය. මෙම මූලික අයිතිවාසිකම්වලට සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ සහ ආගම ඇදහීමේ නිදහස, වධහිංසාවට භාජනය නොවීමට ඇති අයිතිය, හේතුවක් නොමැතිව අත්අඩංගුවට පත් නොවීමට ඇති අයිතිය, කතා කිරීමේ නිදහස සහ ඕනෑම අයෙකු ඇසුරු කිරීමේ අයිතිය යන අයිතිවාසිකම් ද ඇතුළත් වේ.

1978 ව්‍යවස්ථාවේ 12 වන වගන්තියට අනුව සියලු දෙනාටම සමානාත්මතාවට ඇති අයිතිය සනාථ කෙරේ. එනම් මිනිසුන්ගේ ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය සහ උපන් ස්ථානය නිසා කිසිවෙකුටත් වෙනස්කම් කිරීමට නොහැකි බවයි. 12 වන වගන්තිය මගින් ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ වෙනස්කම් කිරීම තහනම් කරන බවට 2014 දී ශ්‍රී ලංකා රජය විසින් එක්සත් ජාතීන් ඉදිරියේ තහවුරු කරන ලදී. එබැවින්, ශ්‍රී ලංකාව සහ ජාත්‍යන්තර නීතිය යන දෙකම යටතේ, ඔවුන් සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික, හා අන්තර් ලිංගික පුද්ගලයින් නිසා කිසිවෙකුට වෙනස් ලෙස සැලකිය යුතු නොවන අතර, ඔවුන්ට ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම කෙනෙකුට ඇති සමාන අයිතිවාසිකම් සහ රැකවරණයද ලැබිය යුතුය.

2017 දී එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකාවේ තුන්වන විශ්ව ආවර්තිතා සමාලෝචනයේදී ශ්‍රී ලංකා රජය සනාථ කළේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්ව කිසිම පුද්ගලයෙකුට වෙනස් ලෙස සැලකීම සඳහා කිසිදු නීතියක් භාවිතා නොකිරීමට වගබලා ගන්නා බවයි. කෙසේ වෙතත්, අවාසනාවකට, දණ්ඩ නීති සංග්‍රහය සහ පාදඩ ආඥා පනත වැනි නීති තවමත් මිනිසුන්ගේ සැබෑ හෝ වටහා ගත් ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්ව ඉලක්ක කර හිරිහැර කිරීමට යොදා ගනී.

මෙම චිත්‍රකතා, ඇම්නෙස්ටි ජත්‍යන්තර සංවිධනය සමඟ කතා කළ සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික, හා අන්තර් ලිංගික පුද්ගලයින්ගේ සැබෑ ජීවිත තොරතුරු භාවිතයෙන්

නිර්මාණය කර ඇත. මෙම කතාවලින් පෙන්වන්නට බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකාවේ සැබෑ හෝ වටහා ගත් ලිංගික දිශානතිය හෝ ලිංගික අනන්‍යතාව හේතුවෙන් මිනිසුන් මුහුණ දෙන පුළුල් පරාසාත්මක තර්ජන, අපයෝජන සහ විවිධ අයිතිවාසිකම් හා නීති උල්ලංඝනයන් පිළිබඳ කුඩා උදාහරණ කිහිපයකි.

ශ්‍රී ලාංකික රජය සිය ව්‍යවස්ථාව අනුගමනය කරන වගටත් සිය ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අනුකූලව ක්‍රියා කරන බවටත් වහාම සහතික වීමට නම්:

- 365, 365 (අ) , සහ 399 යන වගන්ති දණ්ඩ නීති සංග්‍රහයෙන් ඉවත් කළ යුතුය. එවිට ඕනෑම පුද්ගලයෙකුගේ සැබෑ හෝ වටහා ගත් ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂභාවය නිසා ඔවුන් ඉලක්ක කර හිරිහැර කිරීමට එය භාවිත කළ නොහැක.
- ශ්‍රී ලංකාවේ නීති වලින් පාදඩ ආඥා පනත ඉවත් කළ යුතුය. එවිට ඕනෑම පුද්ගලයෙකුගේ සැබෑ හෝ වටහා ගත් ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව භාවිතයෙන් ඔවුන්ට වෙනස් ලෙස සැලකිය නොහැක.
- මිනිසුන්ගේ සැබෑ හෝ වටහා ගත් ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ භාවය නිසා වෙනස් ලෙස සැලකීමට වෙනත් නීති භාවිතා නොකරන බවට වග බලාගත යුතුය.
- සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික, හා අන්තර් ලිංගික පුද්ගලයින්ට නීතියේ පූර්ණ ආරක්ෂාව ලබා දී ඇති බවට වග බලා ගත යුතුය. ඔවුන්ගේ සැබෑ හෝ වටහා ගත් ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය හේතු කරගෙන පොලීසිය විසින් ඔවුන්ට හිරිහැර කිරීම, ඔවුන්ගෙන් කප්පම් ගැනීම හෝ ඔවුන්ව අපයෝජනයට ලක් කිරීම නොකළ යුතුය.
- ඔවුන්ගේ සැබෑ හෝ වටහා ගත් ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය හේතුවෙන් පොදු සහ පෞද්ගලික ස්ථානවලදී වෙනස් ලෙස සැලකීම්, හිරිහැර කිරීම් හෝ ප්‍රචණ්ඩත්වයට ලක් කිරීම් සිදු නොවීමට නොකිරීමට පියවර ගත යුතුය. එසේ හිරිහැර කිරීම් වලට භාජනය වුවහොත්, පැමිණිලි ඉදිරිපත් කර ආරක්ෂිතව විභාග කළ හැකි යාන්ත්‍රණයක් ඇති බවට රජය වග බලා ගත යුතුය. සියලුම නඩු නිසි ලෙස විමර්ශනය කර වැරදිකරුවන්ට නිසි දණ්ඩණයන් ලබා දීමට කටයුතු කළ යුතුය.

ශ්‍රී ලංකාවේ ජනතාව කළ යුත්තේ:

- කිසිවෙකුටත් ඔවුන්ගේ සැබෑ හෝ වටහා ගත් ලිංගික දිශානතිය හෝ , ලිංගික අනන්‍යතාව නිසා පුද්ගලයින්ට වෙනස් ලෙස සැලකීම, හිරිහැර කිරීම හෝ අපයෝජනයට ලක් කිරීම සිදු නොවන බවට වග බලා ගැනීම.
- සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික, හා අන්තර් ලිංගික පුද්ගලයින්ට සැබෑ මිතුරන් වීම.

01 පරිච්ඡේදය

මංජු



1 කොටස

ඉන් එක සිහිනයක් තමයි විවිධ පාට ලිහිණියෝ සතර දෙනෙක්
සතර දිසාවෙන් ඇවිත්

* සෑම කුලයකටම අයත් පුද්ගලයින්ට සමානව සළකන ලදී.

"ඒ වගේම,
උන්වහන්සේ බුද්ධත්වය ලැබුවායින් පසුව
රජවරු, සිටුවරු, දුප්පත්, පොහොසත්
කිසි භේදයක් නැතුව...
සියලු දෙනාටම එක සේ සැළකුවා."
උන්වහන්සේට ආරාධනා කළ සෑම පුද්ගලයෙකුගේම ගෙදරට දානෙට වැඩියා
උන්වහන්සේ පැවදි වීමට කැමැත්ත පළ කරපු කිසිවෙකුටත් වෙන්ස්කමක් නොපෙන්වා
සියළු දෙනාටම එක හා සමානව සැළකුවා.
මංජු සර්


සර්ට කථා කරන්න ඕනේ කියලා ලොකු හාමුදුරුවෝ අඬගැහුවා
එහෙනං දරුවනේ අදට මෙච්චරයි. ලබන සතියේ ආපහු හම්බුවෙමු. තෙරුවන් සරණයි!
තෙරුවන් සරණයි සර්!
මම දන්නවා මේ දරුවන් මංජුට ගොඩක් කැමතියි කියලා.
ඒ වුනාට දෙමව්පියෝ කිහිපදෙනෙක්ම මංජු අපේ දහම් පාසලේ උගන්වන එක නවත්වන්න කියලා මට පැමිණිලි කරලා තියෙනවා.
ඇයි ලොකු හාමුදුරුවනේ, මොකද වුනේ?
ඒගොල්ලන්ගෙන් සමහරක් අය මංජු... මේ... ඒගොල්ලෝ අනුමත නොකරන අය ආශ්‍රය කරනවා දැකලා තියෙනවා
ඒ කිව්වේ ලොකු හාමුදුරුවනේ?

ඒගොල්ලෝ කියපු හැටියට මේ ගැහැණු උදවිය වගේ ඇඳුම් ඇඳගත්ත පිරිමි අය
ඒ කිව්වේ මේ සංක්‍රාන්ති ලිංගික අයයි, සමලිංගික අයයි ගැනද ලොකු හාමුදුරුවනේ?
ඔව්
“ලොකු හාමුදුරුවනේ මම නොයෙක් වර්ගයේ අය එක්ක වැඩ කරනවා. ඒ ගොල්ලන්ට සහයෝගය දෙන්න වගේම උගන්නන්නත් එක්ක.
ඒ සමහර අය ඔය දෙමව්පියෝ සාමාන්‍යයෙන් දකින අයට වඩා තරමක් වෙනස් වෙන්න පුළුවන්, හැබැයි ඒගොල්ලෝ කිසි වරදක් කරලා නෑ.”
මම බෞද්ධ ධර්මයට අනුව හැම දෙනාටම එක හා සමානව සලකන්නේ.
ඒක ඔච්චරටම වැරදි දෙයක්ද?
මංජු මම දන්නව දරුවෝ මංජුට ගොඩක් ළෙංගතුයි කියලා. ඒ වුනාට මම මුකුත් නොකළොත් දෙමව්පියෝ දොස් කියන්නේ මට!
මට සමාවෙන්න.
ලොකු හමුදුරුවන්ටයි පන්සලටයි ප්‍රශ්නයක් ඇති කරන්න මම කැමති නෑ.
“මම ම අයින් වෙන්නං.”

මාසයකට පසුව...
මංජු සර්!
මංජු සර් කොහොමද? සර් නැතුව දහම් පාසල හරි පාළුයි.
ඔව් සර්. අනිත් ටීචර්ලා සර් වගේ අපි ගැන වැඩි උනන්දුවක් පෙන්නනනේ නෑ.
එවා ගැන එච්චර හිතන්න එපා පුතා.
දහම් පාසල් යන්නේ බුද්ධ ධර්මය ගැන ඉගෙන ගන්න නේ, ඉස්සෙල්ලා ඒක කරන්න.
හොඳ බෞද්ධයින් විදහට ලොකු මහත් වෙලා හැම දෙනාටම කරුණාවෙනුයි ගෞරවයෙනුයි සලකන්න ඉගෙනගන්න...
...ඒකම එතකොට මට ලොකු අඩම්බරයක්.
එහෙනං මංජු සර් අපි යනවා
තෙරුවන් සරණයි සර්!

01 පරිච්ඡේදය

මංජු



2 කොටස

*උපත් පාලන කොපුවක්


අර මිනිස්සු මං ගැන මොනවා හිතයිද? මම මොකක් හරි වැරැද්දක් කරා කියලා හිතාවි!
මම හැමෝටම ආරක්ෂාකාරී ලිංගික පිළිවෙත් ගැන උගන්වන තුළ්‍ය අධ්‍යාපකයෙක්.
අපි විවිධ පුද්ගලයින්ට කොන්ඩම් පාවිච්චි කළ යුත්තේ ඇයි කියලා උගන්වනවා.
HIV/ STD
ඒ වගේම උපත් පාලන කොපු නැති අයට ඒවා ලබා දෙනවා.
ඒවා භාවිතා කරන්න ලැබෙන්නෙ නැති අය ගොඩක් ලෙඩ වලට මුහුණ දෙන්න පුළුවන්.
මට ඒවයින් වැඩක් නෑ.
අපි ඔහේ වගේ අය ගැන හොඳට දන්නවා.
අපි ගොඩක් අය එක්ක වැඩ කරනවා. සමලිංගික අය එක්ක විතරක් නෙමෙයි. රාළහාමි මට අකමැති පළියට මාව මෙහෙම අත් අඩංගුවට ගන්න බෑ.
ඔය ඇති,

“අපි ඔයාගේ කට උත්තරේ ලියාගන්නං. හෙට උදේට ඔයාට යන්න පුලුවන්.”
බුදු දහම අපිට උගන්වන්නේ සියළු සත්වයින්ට එක හා සමානව මෛත්‍රී කරන්න කියලා. ඒක හුඟක් අපහසු කාර්‍යයක් වුනත්
- මම හැමෝටම, මට අසාධාරණකම් කරන අයටත් මෛත්‍රී කරන්න උත්සාහ කරනවා.
මොකද එයාලත් කවදාහරි දවසක ඒගොල්ලො කරන දේ වැරදියි කියන එක වටහා ගනියි කියලා මම හිතන නිසා.

මට අසාධාරණයක් වුනා. මට අසාධාරණකම් කරපු අය මම සමාජයේ මිනිස්සුන්ට උදව් කරන කෙනෙක් විදිහට දකින්නේ නෑ. මාව ඒ අයට පේන්නේ මට්ටු කළ යුත්තෙක් විදියටයි. ඒ මම කොයි වගේ අයටද ආදරය කරන්න කැමති, මම කවුද කියන හේතු නිසා.

1990දී ශ්‍රී ලංකාව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සම්මුතියට අත්සන් කරන ලදී. මෙම සම්මුතිය තුලින් ජීවත් වීමට ඇති අයිතිය, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, ආගමික නිදහස හා ආශ්‍රය කිරීමේ නිදහස ආරක්ෂා කරනවා. ඒ මගින් වධ හිංසනය, වහල් භාවය හා අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් ද තහනම් කර ඇත. එම අයිතිවාසිකම් තම රටෙහි සියලු පුරවැසියෙක්ටම ඔවුන්ගේ ජාතිය, වර්ණය, ලිංගිකත්වය (මෙයට ලිංගික අභිප්‍රේතයද අඩංගුය) භාෂාව, ආගම, දේශපාලන හෝ අනෙකුත් මත, උපන් දේශය, සමාජ සම්භූතිය, දේපළ, උපත හෝ අනෙකුත් වර්ග භේදයකින් වෙන් නොකොට එක හා සමානව අදාල කිරීමට මෙම සම්මුතියට එකඟ වූ සියලු රජයන් විසින් වග බලා ගත යුතු වේ.

02 පරිච්ඡේදය

කිරුතිකා



SAHAN'S
FOOD PALACE
SHAA Salon
Ladies and Gents
RENUKA
FASHION POINT
NEW NEW PILAWOOS
HOTEL & BAKERY
RING RING
ආ බබා. මම කැම්පස් එකේ ඉදලා ගෙදර යන ගමන් ඉන්නේ. හෙට දවල් කෑමට අපි හම්බු වෙනවා නේද?
ඔව් එහෙම හොදයි. ඔයාව දකින කල් ඉවසල්ලක් නෑ. මම ඔයාට ආදරෙයි
ඔව්. මම ඔයාට 1:30ට විතර එතනදි හම්බු වෙන්නද?
මමත්
05.48
METERED TAXI

10.13
New Message
+94 83 1854491
BEEP
BEEP
මම ගිම්හානී. මේක මල්ලිගේ නොම්බරේ. තාත්තාට අපි දෙන්නා ගැන ආරංචි වෙලා. එයා අපේ මැසේජ් ඔක්කොම කියවලා මගේ ෆෝන් එක එයා ගාව තියාගත්තා. එයාට හොදටම තරහා ගිහිල්ලා තියෙන්නේ. මගේ නොම්බරෙන් එන කෝල් එකක්වත් උස්සන්න එපා. පරිස්සමෙන් ඉන්න මොකද තාත්තා හරි භයානක මිනිස්සුන්ව ආශ්‍රය කරනවා. මම කොහොමහරි ඔයාට ඉක්මනට කතා කරන්නං
!?!
හ්ම්...ඒක හරි පුදුමයි නේ. මේ පැත්තේ ලේසියෙන් කරන්ට් යන්නේ නැහැනේ.
කරන්ට් ගිහිල්ලා තයෙන්නේ අපේ පාරට විතරක්ද කොහෙද
දඩං!
දඩං!
දඩං!
මේ ගේට්ටුව අරින්න!

1980 දී ශ්‍රී ලංකාව කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ එක්සත් ජාතීන්ගේ සම්මුතියට (CEDAW) අත්සන් කරන ලදී. මෙම සම්මුතියට එකඟ වු රටවල් විසින් කානතාවන්ට එරෙහිව සිදුවන සියළු ආකාරයේ වෙනස්කම් නැවැත්වීමට බැඳී සිටී. එනම් කාන්තාවන්ගෙ සමාජතත්වය හා අනෙකුත් ස්වභාවයන් කෙසේ වුවත් කානතාවකට තමා පිළිබඳ ඇති පිළිගැනුමට හෝ කාන්තාවක් ලෙස තෘප්තිමත් වීමට හානි වන හෝ ගැරහෙන ලෙස වෙනස්කම් නොකිරීමට වග බලා ගැනීමයි. කානතාාවන්ට හා පිරිමින්ට එක හා සමාන අයිතිවාසිකම් හා නිදහසක් ලබා දීමයි. එම සම්මතයේ වගන්ති අංක 5(a) ට අනුව මෙම සම්මතියට එකඟ වු රටවල් විසින් ඒකාකීතික ස්ත්‍රී පුරුෂ භූමිකා සැදීමට බලපෑම් කරන සංස්කෘතික හා සමාජයීය රටා වෙනස් කිරීමට බැඳී සිටියි. මෙයට ලිංගික දිශානතිය හා ලිංගික අනන්‍යතාවයද ඇතුලත්වේ.

03 පරිච්ඡේදය

තෙනු





ආ තෙනු, කොහොමද?
ඔයාට අර විශ්‍රාමික වැටුප් පෝරම පුරවන්න මගේ උප්පැන්න සහතිකේ ඕනෙ කිව්ව නේද? ආ මෙන්න.
ඇයි මේකෙ ස්ත්‍රී පුරුෂ භාවය සඳහන් වෙන තැන එක පේළියක ස්ත්‍රී කියලා ලියලා...
තවත් එකක පුරුෂ කියලා ලියලා තියෙන්නෙ?
ඒ මම උප්පැන්න සහතිකේ වෙනස්කම් වගයක් කරපු නිසා.
ඒ මොකෝ?
ඒ මම සංක්‍රාන්ති ලිංගික පුද්ගලයෙක් නිසා.
මම ඉපදුණු දවසෙ ඉඳන් කවුරුත් මාව ගැහැණු කෙනෙක් විදිහට හැඳින්නුවාට
ඒ වුනත් මම දැනගෙන හිටිය නිසා මම පිරිමි කෙනෙක් කියන එක, මගේ අනන්‍යතාවය මට ලිඛිතවම ලියාපදිංචි කරගන්න අවශ්‍ය වුනා.
මොකක්? ඒක හරිම විකෘති දෙයක්නේ?
කොච්චර අස්වාභාවිකද ඒක?
මම දැනගෙන හිටියා මම පිරිමි කෙනෙක් කියලා.
ඒ අය මගේ ශරීරයේ අවයව දිහා බලලා තීරණය කළා මම මොන පාර්ශවයටද අයිති කියන එක.
ඇත්තම කියනවනං මගේ ලිංගිකත්වය මාරු වුනාට පස්සේ තමයි මට සාමාන්‍යයි කියන හැඟීම ඇතිවුනේ.
දැන් තමයි මට හරියට මම විදිහටම ඉන්න පුළුවන් තත්වයක මම ඉන්නේ.
ඔයා එහෙනං දැන් යනවද? මට වැඩ වගයක් තියනවා ඉවර කරගන්න.
හ්ම්ම්... හරි.

පසුවදා...

ආ කොහොමද?
මුකුත් නෑ
මොනවා ගැනද ඔච්චර හිනාවෙන්නේ?
නෑ නෑ මුකුත් නෑ
රොහාන් අපිට කිව්වා ඔයා මොනවගේ කෙනෙක්ද කියලා.
හරි කැතයි.
මෙන්න මෙහෙ වරෙල්ලා යන්න.
මේ ගෑනිද.
පිරිමිද.
මොකාද කියලා දන්නේ නැති එකාට ඉන්න දීලා.


තෙනු, ඔයාගේ ලියවිල්ල මම කියවලා බැලුවා, හැමදේම තිතට තියනවා, ඔක්කොම හරියටම කෙරිලා තියෙනවා.
රොහාන් මේක පරීක්ෂා කළාට පස්සේ ප්‍රධාන කාර්යාලයට යවන්න පුළුවනි.
බොහොම ස්තුතියි විජේ
ඒක නෙමෙයි, අර රොහාන් ඔයා ගැන කතා පැතුරුවාට පස්සෙ
වැඩපොළේ අයත් එක්ක ඇතිවෙච්ච ප්‍රශ්න තවම තියෙනවද?
ඔව් විජේ
ඔයා ඇරෙන්න අනික් හැමෝම මාව කොන් කරලා තියෙන්නෙ.
මම දන්නවා රොහාන්ට නං සංක්‍රාන්ති ලිංගික අය ගැන භීතිකාවක් තියෙනවා කියන එක.*
හැබැයි අනිත් අයත් ඔහොම හැසිරෙයි කියලා මම හිතුවෙ නෑ.
මට තේරෙනවා.
මට ඒ ගැන දුකයි තෙනු.
ඒ වුනාට ඔයාගේ වැඩ හුඟක් හොඳයි. ඔයාගේ අංශ ප්‍රධානියා හැටියට මම ඔයාට පුළුවන් සහයක් දෙන්නං.
මම දන්නවා වැඩපොළේ හැමෝම ඔයාට විරුද්ධයි කියන එක. ඒ වුනාට ඔයාට සුහද, විශ්වාසවන්ත කාවහරි අවශ්‍යයි.
මට පුළුවන් ඒ කෙනා වෙන්න.

මට තේරෙන්නේ නෑ ඇයි ප්‍රධාන කාර්යාලෙන් මේක වැරදියි කියලා ආපහු එවලා තියෙන්නේ කියලා.
මම මේ ලියවිල්ල කියවපු වෙලාවේ ඔක්කොම හරියට තිබුනානේ.
මේ මම දාපු සංඛ්‍යාලේඛන නෙමෙයිනේ විජේ.
කවුරුහරි ඒවා වෙනස් කරලා
මොකක්? ඒක වෙන්න බෑ. මෙහෙට දෙන්න බලන්න.
...
ඔයා හරි!
මේ දත්ත එහෙම වෙනස් වෙලා නේ.
කොහොමද දෙයියනේ ඒක එහෙම වුනේ?
ඕක මට දීලා යන්න. මොකද වුනේ කියලා මම හොයලා බලන්නං.

උනේ මොකද්ද කියලා මම හොයාගත්තා.
රොහාන් මේ ලියවිල්ල අපේ අනිත් වැඩපොළට යවලා
ඒගොල්ලෝ ලවා සංඛ්‍යාලේඛන වැරදි ඒවාට වෙනස් කරලා ඒ අය අතේම තමයි ප්‍රධාන කාර්යාලයට යවලා තියෙන්නේ.
ඇයි රොහාන් මෙහෙම දෙයක් මට කළේ?
මම සංක්‍රාන්ති ලිංගික පුද්ගලයෙක් වුන පළියට ඇයි මෙච්චර මාත් එක්ක තරහා?
තෙනු
මට හිතෙනවා ඔයා අයින් වුනොත් ඔයාටමයි හොඳ කියලා.
ඔයාව ආරක්ෂා කරන්න මට මීට වැඩිය බැරි වෙයි.
රොහාන් ඔයාට වල කපනවා කියලා හොඳටම පැහැදිලියි.
එයා ඔයාව අස් කරවන්න හේතුවක් හොයාගන්න කලින් ඔයාම අයින් වුනොත් හොඳයි.



1980දී ශ්‍රී ලංකාව ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සම්මුතියට **(ICESCR)** අත්සන් කරන ලදී. මෙම සම්මුතිය හා එකතු වුනු රටවල්, සිය පුරවැසියන්ට සුබවාදී සේවා තත්වයන් බිහිකිරීමට බැඳී සිටිනවා (උදාහරණ ලෙස ගතහොත්, සාධාරණ වැටුප්, යහපත් ජීවන රටාවක්, ආරක්ෂිත සේවා ස්ථානයක්, උසස් වීම් සඳහා සම අවස්ථා, විවේක ගැනීමට සාධාරණ කාලසීමා ද ඇතුලත් වේ.) මෙම අයිතිවාසිකම් ස්ත්‍රී පුරුෂ (මෙයට ලිංගික දිශානතිය හා ලිංගික අනන්‍යතාවයද ඇතුලත් වේ) , ජාති, ආගම්, භාෂා, දේශපාලන හෝ අනෙකුත් ප්‍රතිභාහිර අදහස්, සමාජ ප්‍රභවය, වත්කම්, උපත හෝ අනෙකුත් තරාතිරම් භාව භේද නොතකා, එක හා සමානව සියළු පුරවැසියෙකුටම අදාල විය යුතුය. එම නිසා, සිය ලිංගික දිශානතිය හෝ අනන්‍යතාවය හේතුවෙන් ඔවුන්ට අසාධාරණකම් හෝ වෙනස්කම් කිසිම සේවා ස්ථානයක සිදුනොවිය යුතුය.

04 පරිච්ඡේදය

සමනලි



හෙලෝ
සමනලී. ලලිතා ඉස්පිරිතාලේ ඇඩ්මිට් කරලා.
ඇයි?
මොනවා වෙලාද?
එයාට ඇක්සිඩන්ට් එකක් වෙලා. බය වෙන්න දෙයක් නෑ, ඒක එච්චර බරපතල දෙයක් නොවෙයි.
මම දන්නවා මොන ඉස්පිරිතාලෙද කියලා. අපිට එයාගෙ ගෙදර ඉඳලා එතට යන්න පුළුවන්.
දැන් අපි ඔක්කොමලා මෙතන ඉඳන් මහා ඉස්පිරිතාලෙට යන්නෙ කොහොමද?
අයියෝ, ගල්කිස්ස හන්දියට ඇවිදලා, එතනින් අපිට ත්‍රීවීල්වල යන්න පුළුවන්.
හරි එහෙනං දැන්ම යමු. නැත්තං පරක්කු වෙනවා.

NEW TAJ HOTEL
මොකද මෙතන කරන්නේ?
අපි යාළුවෙක්ව බලන්න ඉස්පිරිතාලෙට යන්න ත්‍රීවීල් එකක් එනකං ඉන්නවා.
මෙච්චර ගොඩක් කට්ටිය?
ඔව් අපි ඔක්කොම එකට යන්නේ.

අපිට ඔයාලගේ අයිඩෙන්ටි පෙන්නන්න.
මේවා පිරිමි අයගේ අයිඩෙන්ටි නේ?
සර, අපි සංක්‍රාන්ති ලිංගික අය.
නගිනව පොලිස් ජීප් එකට.
ඇයි?
අපි ඔහේලාව අත්අඩංගුවට ගන්නවා.

ඇයි? අපි කිසි වැරැද්දක් කරලා නෑනේ?
අපි මේ වීල් එකක් නවත්තන්න හැදුවා විතරයි!
කිසිම හේතුවක් නැතුව අපිව එහෙම අත්අඩංගුවට ගන්න බෑ!
සර අපිට අයිඩෙන්ටිය මාරු කරන්න පුළුවන් වෙන්නේ අපේ සංක්‍රාන්ති ක්‍රියාවලිය සම්පූර්ණ වුනාට පස්සෙයි.
මම ඕවා ගැන දන්නෙත් නෑ මට ඒ කිසිදෙයකින් වැඩකුත් නෑ.



*1841 පාදඩ ආඥාපනත යටතේ සංක්‍රාන්ති පුද්ගලයින්ට විරුද්ධව චෝදනා ගොනුකරන ලදී

1955දී ශ්‍රී ලංකාව විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළබඳ විශ්ව ප්‍රකාශනය අපරානුමත කරන ලදී. එම විශ්ව ප්‍රකාශනය ආරම්භ වන්නේ සියළු මනුෂ්‍යයෙක්ම නිදහස්ව උපත ලබන බවටත්, එක හා සමාන අයිතීන් භුක්ති විදින බවත් ප්‍රතිඥා දෙමිනි. මෙම ප්‍රකාශනයේ ඇති අයිතීන් රටේ ජීවත් වෙන සෑම පුරවැසියෙක්ටම ඔවුන්ගේ ජාතිය, වර්ණය, ලිංගික අනන්‍යතාවය (ලිංගික දිශානතියද මෙයට ඇතුලත් වේ) , භාෂාව, ආගම, දේශ්පාලනික හෝ අනෙකුත් අදහස්, පුරවැසිභාවය, සමාජ සම්භූතිය, දේපළ, උපත හෝ අනෙකුත් කිසිදු තරාතිරමකින් තොරව අදාල විය යුතුය. එහි 07 වන වගන්තියට අනුව ඒ සියල්ලන්ටම නීතියේ ආරක්ෂාව, හා සැලකිල්ල එක හා සමානව ලැබිය යුතුය. වගන්ති අංක 09ට අනුව කිසිම අයෙකු අභිමතානුකූලව අත් අඩංගුවට ගැනීමට හෝ රඳවා තබා ගැනීමට හෝ පිටුවහල් කිරීමට නොහැකිය.

ඇම්නෙස්ටි ජාත්‍යන්තර සංවිධානය යනු ලෝකව්‍යාප්ත මානව හිමිකම් සුරැකීමේ ව්‍යාපාරයකි. එක් පුද්ගලයෙකුට සිදුවන අසාධාරණයන් අප සියල්ලන්ටම බලපායි.

CONTACT US

info@amnesty.org

JOIN THE CONVERSATION

www.facebook.com/AmnestySouthAsia

@amnestysasia

මංජුට පොලීසිය විසින් අයථා ලෙස සලකන ලද්දේ ඔහුගේ ලිංගික දිශානතිය නිසා වූ අතර සමනලීට එසේ වූයේ ඇගේ ලිංගික අනන්‍යතාව නිසාය. කිරුතිකා විසින් හිරිහැර කිරීම්වලට හා අපවාදය ලක් වූයේ ඇගේ අයිතීන් නීතිය විසින් ආරක්ෂා නොකරන නිසාය. තේනුට ඔහුගේ සේවා ස්ථානයේදී නොයෙක් හිරිහැරවලට හා අයුතු බලපෑම්වලට මුහුණ දීමට සිදු වූයේ ඔහුගේ ලිංගික අනන්‍යතාව නිසාය.

1883දී බ්‍රිතාන්‍යය විසින් ඔවුන් දිවයින යටත්විජිතකරණයේදී පනවන ලද නොයෙක් නීති හා රෙගුලාසි සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්ති ලිංගික, හා අන්තර් ලිංගික ප්‍රජාවට අසාධාරණ ලෙස සැලකීමට අදද භාවිත වේ. එම අසාධාරණකම් නීති විරෝධී ක්‍රියා බවට පත් කරන ව්‍යවස්ථාමය විධිවිධාන සකසා තිබුනද සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්ති ලිංගික, හා අන්තර් ලිංගික ප්‍රජාව එම අසාධාරණකම්වලට, හිරිහැර කිරීම්වලට හා හිංසනයටද තවදුරටත් භාජනය වන්නේ ඔවුන්ගේ ලිංගික දිශානතිය හා ලිංගික අනන්‍යතාව නිසාය. මෙම චිත්‍රකතා ලියවෙන්නේ සත්‍ය සිදුවීම් මත ය. ඒ සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්ති ලිංගික, හා අන්තර් ලිංගික සමාජයීය පුද්ගලයින් ඇම්නෙස්ටි ජාත්‍යන්තර සංවිධානය සමග කරන ලද සාකච්ඡා ආශ්‍රයෙනි.

INDEX: ASA 37/1477/2019
DECEMBER 2019
LANGUAGE: SINHALA
amnesty.org

AMNESTY INTERNATIONAL